ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපනවේදී (ස්වාභාවික විද්‍යා) උපාධිය - 6 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2008

යෞවනයාගේ මනෝවිද්‍යාව - **ESU 4301**

කාලය පැය තුනයි.

---

දිනය - 2008.08.25 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලටද 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට ද පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. කෙනෙකුගේ ජීවිතයේ වැදගත් අවධියක් ලෙස "යෞවන විය" සැලකීමට ප්‍රධාන හේතු තුනක් (03) කෙටියෙන් පැහැදිලි කරන්න.

02. වියුක්ත චින්තන අවධියෙහි කැපී පෙනෙන ඉහළ ප්‍රජානන හැකියා දෙකක් (02) නිදසුන් දක්වමින් විස්තර කරන්න.

03. සිසුන්ගේ වියුක්ත චින්තනය වැඩි දියුණු කිරීමට ගුරුවරුන් විසින් භාවිත කළ හැකි ක්‍රම තුනක් සඳහන් කරන්න.

04. යෞවනයාගේ පෞරුෂ සංවර්ධනය සුසාධ්‍ය කිරීම පිණිස පාසලට යොදාගත හැකි ක්‍රියාමාර්ග දෙකක් පැහැදිලි කරන්න.

05. යෞවනයාගේ ස්ව සංකල්පය සංවර්ධනය කිරීමට සම වයස් කණ්ඩායම බලපාන අන්දම නිදසුන් තුනක් ඇසුරෙන් කෙටියෙන් පැහැදිලි කරන්න.

06. සිසුන්ගේ චර්යා හැඩගැස්වීමෙහිලා ප්‍රතිසාධනය භාවිත කළ හැකි අන්දම සුදුසු නිදසුන් දෙකක් මගින් කෙටියෙන් පැහැදිලි කරන්න.

07. ඉගෙනුම් මාරුව සුසාධ්‍ය කිරීමට භාවිත කළ හැකි උපායමාර්ග දෙකක් නම් කරන්න.

08. යෞවන වියේ සිදුවන තීරණාත්මක වෙනස්කම් දෙකක් නම් කොට, ඒවා සුසාධ්‍ය කිරීමට පන්තිභාර ගුරුවරයාගේ භූමිකාව කෙටියෙන් පැහැදිලි කරන්න.

## 2 වන කොටස

09. i. පියාජේගේ ප්‍රජානන සංවර්ධන න්‍යායයේ මූලධර්ම තුනක් (03) පැහැදිලි කරන්න.

ii. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය ඵලදායි කර ගැනීම සඳහා එම මූලධර්ම කොතෙක් දුරට අදාළ වේදැයි පරීක්ෂා කරන්න.

10. i. "සමස්ථ සංවර්ධනය" යන පදය නිර්වචනය කරන්න.

ii. සිසුන්ගේ සමස්ථ සංවර්ධනය සුසාධ්‍ය කිරීමට පංති කාමර ක්‍රියාකාරකම් කෙසේ සංවිධානය කළ යුතුද යන්න විභාග කරන්න.

11. පහත සඳහන් ඕනෑම තුනක් (03) පිළිබඳව කෙටි සටහන් ලියන්න.

i. යෞවනයාගේ චිත්තවේගීය සංවර්ධනයට සම්බන්ධ ගුරු භූමිකාව
ii. යෞවනයන්ගේ සමබර පෞරුෂයක් සංවර්ධනයෙහි ලා ඉවහල් වන සාධක
iii. ස්වයං පෙළඹවීම ඇති පුද්ගලයකුගේ ගති ලක්ෂණ
iv. යෞවනයාගේ සමාජ අවශ්‍යතා

12. i. "චිත්තවේග" අර්ථ දක්වා විවිධ චිත්තවේග වලට සම්බන්ධ චර්යාවන් පැහැදිලි කරන්න.

ii. සුදුසු නිදසුන් ඉදිරිපත් කරමින් චිත්තවේග යෞවනයන්ගේ පෞරුෂ ගැටළුවලට හේතු විය හැකි ආකාරය පැහැදිලි කරන්න.

iii. සිසුන්ට චිත්තවේග ප්‍රකාශ කිරීම සඳහා ඇති අවස්ථා පුළුල් කිරීමට ගුරුවරයකුට යොදාගත හැකි ක්‍රියාමාර්ග තුනක් සාකච්ඡා කරන්න.

13. i. ෆ්‍රොයිඩ්ගේ මනෝ විශ්ලේෂණවාදී න්‍යායට අනුව පෞරුෂයේ සංරචක තුන නම්කොට, පැහැදිලි කරන්න.

ii. පෞරුෂයට අදාල එම සංරචක තුනෙහි අන්තර් ක්‍රියාකාරිත්වය විශ්ලේෂණය කරන්න.

iii. එම සංරචක තුනෙහි ක්‍රියාකාරිත්වය පෞරුෂයෙහි වෙනස්කම්වලට හේතුවන ආකාරය සුදුසු නිදසුන් ඇසුරෙන් පැහැදිලි කරන්න.

14. i. කිසියම් න්‍යායක් තෝරාගෙන එම න්‍යායට අනුව යෞවනයන් තුළ ඉගෙනීම සිදුවන ආකාරය සුදුසු නිදසුන් මගින් පැහැදිලි කරන්න.

ii. ඔබ තෝරාගත් න්‍යායට අනුව ගුරුවරුන්ගේ හා සිසුන්ගේ කාර්යභාරය සාකච්ඡා කරන්න.

- හිමිකම් ඇවිරිණි. -